සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 10	විෂයය / பாடம் / Subject: කෘෂි හා ආහාර තාක්ෂණය	පත්‍රය / வினாத்தாள் / Paper: I	කාලය / காலம் / Time: පැය 01

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) වැවක කොටස්වන බිසෝ කොටුවේ හා දිය කැට පහනේ කාර්යය පිළිවෙලින්,
(1) සොරොව්ව මත ඇතිවන ජල පීඩනය අවම කිරීම හා වැවේ ජලය ආරක්ෂා කිරීම.
(2) වැවේ රොන්මඩ ඉවත් කිරීම හා වැවේ ඉවුර ඛාදනය වීම වැළැක්වීම.
(3) වැවෙන් ජලය පිටවීම පාලනය හා වැවේ ජල මට්ටම සොයාගැනීම.
(4) සොරොව්ව මත ඇතිවන ජල පීඩනය අවම කිරීම හා වැවේ ජල මට්ටම බලා ගැනීම.

(02) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්ක පමණක් දැක්වෙන පිළිතුර තෝරා දක්වන්න.
(1) ගාල්ල, මාතර හා කුරුණෑගල
(2) කොළඹ, ගම්පහ හා හම්බන්තොට
(3) කළුතර, ගම්පහ හා කෑගල්ල
(4) මහනුවර, කෑගල්ල හා බදුල්ල

(03) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය භාවිතයෙන් සිසුවෙක් වායුගෝලීය සාපේක්ෂ ආරක්ෂාව සොයන ලදී. එහි දී ඔහු අනුගමනය කළ පියවර පහත දැක්වේ.
A - තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමාන පාඨාංක ලබා ගැනීම.
B - සාපේක්ෂ ආර්ද්‍රතා වගුවේ වියළි බල්බ උෂ්ණත්වමානයේ පාඨාංකයට අදාළ පේළිය සොයා ගැනීම.
C - සාපේක්ෂ ආර්ද්‍රතා වගුවේ උෂ්ණත්ව වෙනසට අදාළ තීරය සොයා ගැනීම.
D - තෙත් හා වියළි බල්බ පාඨාංක අතර වෙනස ලබා ගැනීම.
E - සාපේක්ෂ ආර්ද්‍රතා වගුවේ වියළි බල්බ උෂ්ණත්වමාන පාඨාංකය හා උෂ්ණත්ව වෙනස අනුව සාපේක්ෂ ආර්ද්‍රතාව සොයාගැනීම.

මෙම සිසුවා ක්‍රියාකාරකමේ දී අනුගමනය කළ යුතු නිවැරදි අනුපිළිවෙල වන්නේ,
(1) A, B, C, D හා E ය.
(2) A, D, B, C හා E ය.
(3) A, B, D, E හා C ය.
(4) A, B, C, E හා D ය.

(04) පතන සීඝ්‍රතාව යනු,

(1) භූමියේ උච්චත්වය ඉහළ යන විට සාපේක්ෂ ආර්ද්‍රතාව අඩුවීම ය.

(2) භූමියේ උච්චත්වය පහළ යන විට ජලවහනය අඩුවීම ය.

(3) භූමියේ උච්චත්වය ඉහළ යන විට උෂ්ණත්වය අඩුවීම ය.

(4) භූමියේ අවපාත ඇති විට උෂ්ණත්වය අඩුවීම ය.

(05) බෝග වගාවේ දී ආලෝකයේ බලපෑම දැක්වෙන ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

- ඇන්තූරියම් සහ බිගෝනියා වැනි ශාක, සෙවණ සහිත පරිසරයක දී මනාව වර්ධනය වේ.
- කෝපි ශාකයේ පුෂ්පීකරණය සිදුවන්නේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල දී ය.
- කෙසෙල් කැන් වර්ධනයවන කාලසීමාවේ දී නිල් පැහැති පොලිතින්වලින් ආවරණය කරනු ලැබේ.

මෙම සංසිද්ධි තුන සඳහා බලපාන ආලෝකයේ ගුණාංග පිළිවෙලින්,

(1) ආලෝක කාලසීමාව, ආලෝක තීව්‍රතාව, ආලෝකයේ ගුණාත්මය

(2) ආලෝක තීව්‍රතාව, ආලෝක කාලසීමාව, ආලෝකයේ ගුණාත්මය

(3) ආලෝක තීව්‍රතාව, ආලෝකයේ ගුණාත්මය, ආලෝක කාලසීමාව

(4) ආලෝකයේ ගුණාත්මය, ආලෝක කාලසීමාව, ආලෝක තීව්‍රතාව

(06) පහත දක්වා ඇත්තේ පස නිර්මාණය වීමේ එක් පියවරක දී එම ක්‍රියාවලියට බලපාන සාධක ය.

- පාෂාණ සිදුරුවල ජලය මිදීම.
- දිවා හා රාත්‍රී උෂ්ණත්වවල වෙනස.
- සතුන්ගේ කුර ගැටීම.
- ගලායන ජලය.

මෙම පස නිර්මාණය වීමේ පියවර හා එයට බලපාන සාධකය පිළිවෙලින් වන්නේ,

(1) පාෂාණ ජීර්ණය හා භෞතික සාධක ය.

(2) පාෂාණ ජීර්ණය හා රසායනික සාධක ය.

(3) පාෂාණ ජීර්ණය හා ජෛවීය සාධක ය.

(4) පාංශු ජනනය හා දේශගුණික සාධක ය.

(07) පස් අංශු දෙකක විෂ්කම්භ පහත දැක්වේ.

A - 0.001 mm

B - 0.15 mm

මෙම පස් අංශු අයත්වන පාංශු ඛනිජ වර්ග වන්නේ,

(1) A - රළුවැලි , B - රොන්මඩ වේ.

(2) A - මැටි, B - රොන්මඩ වේ.

(3) A - රොන්මඩ, B - සියුම්වැලි වේ.

(4) A - මැටි , B - සියුම්වැලි වේ.

(08) පසක් සංතෘප්ත අවස්ථාවේ සිට ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවට පත්වන විට පසෙන් ඉවත්වන ජල ආකාර/ජල ආකාරය වන්නේ,

(1) කේශාකර්ෂණ ජලයයි.

(2) ගුරුත්වාකර්ෂණ ජලයයි.

(3) ජලාකර්ෂණ ජලයයි.

(4) කේශාකර්ෂණ හා ජලාකර්ෂණ ජලයයි.

(09) A, B, C ලෙස නම් කළ සිසු කණ්ඩායම් තුනක් විසින් රෝල් ක්‍රමය භාවිතයෙන් පාංශු නියැදි තුනක වයනය සෙවීම සිදුකරන ලදී. එහිදී ලද නිරීක්ෂණ පහත දැක්වේ,

A - රෝල සෑදිය හැකි නමුත් මුද්ද සෑදීමේ දී කැඩුණි.

B - රෝල සෑදීම සිදු කරන අවස්ථාවේ රෝල තැනින් තැන කැඩුණි.

C - රෝල හා මුද්ද හොඳින් සෑදිය හැකි විය.

A, B හා C පස් නියැදි තුනේ වයනය වන්නේ පිළිවෙලින්,

(1) වැලි, වැලි ලෝම, හා මැටි ය.
(2) වැලි ලෝම, මැටි ලෝම, හා මැටි ය.
(3) මැටි ලෝම, වැලි ලෝම, හා මැටි ය.
(4) වැලි, මැටි ලෝම, හා වැලි ලෝම ය.

(10) පසක් ආම්ලික වීමට හේතුවක් වන්නේ,

(1) ලවණ සහිත වාරි ජලය භාවිතය ය.
(2) පසෙන් ජලය අධිකව වාෂ්පීකරණය වීම ය.
(3) අධික වර්ෂාපතනය දීර්ඝ කාලයක් පැවතීම ය.
(4) මුහුදු සුළඟ සමඟ ලවණ සහිත ජල බිංදු පැමිණීම ය.

(11) පහත රූප සටහනේ දැක්වෙන්නේ පාංශු ඛාදන අවස්ථාවකි.
එම පාංශු ඛාදන ආකාරය වන්නේ,



(1) විසිරි ඛාදනයයි.
(2) ස්ථරීය ඛාදනයයි.
(3) අභ්‍යන්තර ඛාදනයයි.
(4) ඇගිලි ඛාදනයයි.

(12) සිසුවෙක් විසින් කරන ලද පරීක්ෂණයක දී පස් නියැදියක pH අගය 7.5 ලෙස සොයා ගන්නා ලදී. එම පස,

(1) ප්‍රබල ආම්ලික පසකි. (2) ආම්ලික පසකි.
(3) භාෂ්මික පසකි. (4) ප්‍රබල භාෂ්මික පසකි.

(13) A රාමුව යනු,

(1) තවාන් පාත්ති සකස් කිරීමට උපයෝගි කර ගන්නා උපකරණයකි.
(2) බෑවුම් භූමියක සමෝච්ඡ රේඛා ලකුණු කිරීමට උපයෝගි කර ගන්නා උපකරණයකි.
(3) සාපේක්ෂ ආර්ද්‍රතාව මැනීම සඳහා යොදාගන්නා උපකරණයකි.
(4) භූමියෙන් ජලවහනය දියුණු කිරීමට යොදාගන්නා උපකරණයකි.

(14) ප්‍රයෝජන අනුව බෝග වර්ගීකරණය කිරීමේ දී අපනයනය සඳහා යොදාගන්නා වැවිලි බෝග කාණ්ඩයට අයත් බෝග,

(1) කුරුඳු, කෝපි හා ගම්මිරිස් ය. (2) පුවක්, ගම්මිරිස් හා කරාබුනැටි ය.
(3) තේ, පොල් හා රබර් ය. (4) කිරිඅල, බුලත් හා ගම්මිරිස් ය.

(15) පහත රූපයේ පෙන්වන කෘෂි උපකරණය භාවිත කරන අවස්ථාව හා යොදනු ලබන බලය අනුව වර්ගීකරණය කර ඇති නිවැරදි පිළිතුර තෝරන්න.

භාවිත කරන අවස්ථාව	යොදාගනු ලබන බලය
1. ප්‍රාථමික බිම් සැකසීම	යන්ත්‍ර බලය
2. ප්‍රාථමික බිම් සැකසීම	මිනිස් බලය
3. ද්විතියික බිම් සැකසීම	සත්ත්ව බලය
4. ඇලි හා වැටි සැකසීම	යන්ත්‍ර බලය



(16) වී වගාවේ දී භාවිත කරන අතුරුයත් ගෑමේ උපකරණය වන්නේ,

(1) ජපන් රොටරි වීඩරය ය.
(2) අත් මුල්ලුව ය.
(3) ස්විස් හෝව ය.
(4) තුන්පුරුක් කල්ටිවේටරය ය.

(17) තවාන් පාත්තියක බීජ සංස්ථාපනය කිරීමේ දී කුඩා බීජ සඳහා,

(1) පේළි අතර පරතරය 10 cm ක් හා ඇලියක ගැඹුර 6 mm විය යුතු වේ.
(2) පේළි අතර පරතරය 15 cm ක් හා ඇලියක ගැඹුර 4 mm විය යුතු වේ.
(3) පේළි අතර පරතරය 5 cm ක් හා ඇලියක ගැඹුර 6 mm විය යුතු වේ.
(4) පේළි අතර පරතරය 10 mm ක් හා ඇලියක ගැඹුර 10 mm විය යුතු වේ.

(18) තවානක් නඩත්තු කිරීමේ දී වසුන් යෙදීමෙන්,

A - බීජ ප්‍රරෝහණයට අවශ්‍ය තෙතමනය ආරක්ෂා වේ.
B - වල් පැළෑටි බීජ පැළවීම පාලනය වේ.
C - බීජ ප්‍රරෝහණයට අවශ්‍ය උෂ්ණත්වය අඩු වේ.

ඉහත A, B හා C යන වගන්ති අතරින් සත්‍ය වන්නේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි
(4) A, B හා C යන සියල්ල ම ය.

(19) ඉසින ජලසම්පාදනය පිළිබඳ වඩාත් ම නිවැරදි වගන්තිය තෝරන්න.

(1) බෝගයේ පත්‍රවලට ජලය ලැබුණ ද මූල මණ්ඩලයට ප්‍රමාණවත් ලෙස ජලය නොලැබේ.
(2) අධික සුළං තත්ත්ව යටතේ ද ගැටලුවකින් තොරව භාවිත කළ හැකි ය.
(3) පුෂ්ප පරාගනය වන අවධියේ දී යොදා ගැනීම සුදුසු නැත.
(4) උසින් වැඩි ශාක සඳහා ද භාවිත කළ හැකි ය.

(20) පසේ අඩංගු ජලය ශාක මගින් ලබා ගෙන ඉන්පසුව ඉවත්ව යෑම හඳුන්වන්නේ,

(1) වාෂ්පීකරණය ලෙසයි.
(2) උත්ස්වේදනය ලෙසයි.
(3) මතුපිට අපධාවය ලෙසයි.
(4) ගැඹුරු වැස්සීම ලෙසයි.

(21) කොළ පොහොර ලෙස යොදාගත හැකි රනිල ශාක පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) ග්ලිසීරියා, සැල්විනියා
(2) ගිණිතෘණ, කැකුණ
(3) වල්සූරියකාන්ත, ජපන් ජබර
(4) අඬනහිරියා, ඉපිල් ඉපිල්

(22) පලතුරු බෝග සඳහා පොස්පරස් පෝෂකය ලබා දීමට වඩාත් ම සුදුසු රසායනික පොහොර වර්ගය වන්නේ,

(1) ඇමෝනියම් සල්ෆේට් ය. (2) මියුරේට් ඔෆ් පොටෑෂ් ය.

(3) රොක් පොස්පේට් ය. (4) ඩොලමයිට් ය.

(23) අඩු පරතරයක් සහිතව වගා කර ඇති බෝගවලට පොහොර යෙදීමට සුදුසු ක්‍රමය කුමක් ද?

(1) අතින් ඉසීම (2) පේළි අතර යෙදීම.

(3) පැළ වටා කවාකාරව යෙදීම. (4) තැනින් තැන වලවල් සකස් කර යෙදීම.

(24) කොම්පොස්ට් පොහොර සැකසීමේ දී පොහොරවල ගුණාත්මකභාවය වැඩිකර ගැනීමට වඩාත් ම සුදුසු වන්නේ පහත කුමන තත්වයේ ශාක කොටස් භාවිත කිරීම ද?

(1) ඉතා ළපටි කොටස් ය. (2) මධ්‍යස්ථ ලෙස මේරූ කොටස් ය.

(3) හොඳින් මේරූ කොටස් ය. (4) වියළී ගිය කොටස් ය.

(25) තවාන් පැළවල පාදස්ථය කුණු වී බීජපත්‍ර කළු පැල්ලම් සහිතව හැකිලීම සිදුවන්නේ එම පැළවලට,

(1) කෘමි හානි ඇති වූ විට දී ය.

(2) තවානට ප්‍රමාණවත් පරිදි ජලය සැපයීම සිදු නොවූ විට ය.

(3) දියමලංකෑමේ රෝග තත්ත්වය ඇති වූ විට ය.

(4) තවානට වටපණු හානිය සිදු වී ඇති විට ය.

(26) තවාන් මිශ්‍රණයක තෙතමන තත්ත්වය පරීක්ෂා කිරීමේ දී මිශ්‍රණයෙන් ස්වල්පයක් අතට ගෙන ගුලියක් ලෙස මුදා හැරිය විට දී ,

(1) ගුලිය ක්‍රමයෙන් ලිහිල් විය යුතු ය. (2) ගුලියක් සේ පැවතිය යුතු ය.

(3) ජලය බේරී ඉවත් විය යුතු ය. (4) එක්වර ම ලිහිල් විය යුතු ය.

(27) පහත ද්‍රව්‍ය අතරින් ගෘහස්ත විසිතුරු පැළෑටි සඳහා ජලසම්පාදන ක්‍රමයක් සැකසීමට යොදාගත හැකි ද්‍රව්‍ය කුමක්ද?

(1) මෙගා බෝතල්. (2) මැටි කළ.

(3) ස්ටයිරෆෝම් පෙට්ටි. (4) පොලිතීන් බෑග්.

(28) ශාකවල පඳුරු දැමීම හොඳින් සිදුවීම සඳහා අත්‍යවශ්‍යවන මහා පෝෂකය වන්නේ,

(1) නයිට්‍රජන් ය. (2) පොස්පරස් ය.

(3) පොටෑසියම් ය. (4) කැල්සියම් ය.

(29) පහත වල් පැළෑටි අතරින් ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටි පමණක් අඩංගුවන කාණ්ඩය/ කාණ්ඩ තෝරන්න.

A - යෝධ නිදිකුම්බා/තුනැස්ස/ගොඩමාරුක්

B - විඩේලියා/පාතීනියම්/ගඳපාන

C - ඇපල/තුන්හිරියා/ජපන් ජබර

D - ගිණිතෘණ/පිලිපින් ෆයර් වර්ක්/සැල්විනියා

(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා D ය.

(30) වල් පැළ පාලනයේ දී අතින් වල් පැළ නෙලීම බහුලව සිදුකරනු ලැබේ. අතින් වල් නෙලීමේ දී ඇතිවන ගැටලුවක් වන්නේ,

(1) බඳුන්ගත පැළ සඳහා යොදා ගැනීම අපහසු වීම ය.

(2) පරිසර දූෂණයක් සිදු නොවීම ය.

(3) භූගත කඳන් සහිත වල් පැළ සඳහා සුදුසු නොවීම ය.

(4) වටිනාකම වැඩි බෝග වර්ග සඳහා පමණක් යෝග්‍ය ක්‍රමයක් වීම ය.

(31) රයිසොක්ටෝනියා (Rhizoctonia) යනු ශාක රෝග ඇති කරන රෝග කාරකයකි. මෙම රෝග කාරකය,

(1) දිලීරයකි. (2) බැක්ටීරියාවකි.

(3) වෛරසයකි. (4) නෙමටෝඩාවෙකි.

(32) කෙසෙල් වගා බිමක වඳ පීදීමේ රෝගය පැතිරීයාම වැළැක්වීමට කළ යුතු වඩාත්ම සුදුසු පිළියම වන්නේ,

(1) දිලීර නාශක යෙදීම ය.

(2) පස ජීවාණුහරණය කිරීම ය.

(3) රෝගී ශාක උදුරා විනාශ කිරීම ය.

(4) පෙරමෝන උගුල භාවිත කිරීම ය

• 33, 34, 35, ප්‍රශ්න සඳහා පහත රූප සටහන් උපයෝගි කර ගන්න.



(A) (B) (C) (D)

(33) A, B, C හා D රූපවලින් දැක්වෙන්නේ,

(1) ඉල්මැස්සා, එපිලැක්නා, මී මැස්සා හා අවුලකපෝරා ය.

(2) පොල් රතු කුරුමිණියා, අවුලකපෝරා, බත්කූරා හා ලේඩිබර්ඩ් කුරුමිණියා ය.

(3) කෙසෙල් ගුල්ලා, ලේඩිබර්ඩ් කුරුමිණියා, දෙබරා හා පලතුරු මැස්සා ය.

(4) පොල් කළු කුරුමිණියා, වන්දා, දෙහි සමනළයා හා වී ඉපියා ය.

(34) ඉහත දැක්වෙන කෘමීන් අතරින් ගොවියාගේ මිතුරන් ලෙස සැලකෙන කෘමීන් වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා C ය.

(35) ඉහත කෘමීන් අතරින් කීට හා සුහුඹුල් යන අවස්ථා දෙකේ දී ම බෝගවලට හානි සිදුකරන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(36) වී ශාකය, තෘණ කාණ්ඩයට අයත් අනෙක් පැළෑටිවලින් වෙන්කර හඳුනාගැනීමට උපකාරී වන්නේ,

(1) පත්‍ර කොපුව ය. (2) කර්ණිකා ය. (3) පින්වලය ය. (4) ධජ පත්‍රය ය.

(37) වී වගාව සඳහා දෙවන සී සෑම සිදුකරන්නේ පළමු සී සෑම කර දින කීයකට පසුව ද?

(1) දින 5 - 6 පසුව.
(2) දින 10 - 12 පසුව.
(3) දින 14 - 16 පසුව.
(4) දින 16 - 18 පසුව.

(38) බිත්තර වී නියැදියක තිබිය හැකි උපරිම වල් පැළෑටි බීජ ප්‍රමාණය වී බීජ 500g කට වල් පැළෑටි බීජ,

(1) 5කි.
(2) 10කි.
(3) 15කි.
(4) 20කි.

(39) පැරණි වී ප්‍රභේද හා සැසඳීමේ දී නව වී ප්‍රභේදවල,

(1) පඳුරු දැමීම අඩු ය.
(2) ශාක උසින් වැඩි ය.
(3) පළිබෝධ හානි වැඩි ය.
(4) පොහොර ප්‍රතිචාරය අඩු ය.

(40) 2020 වර්ෂයේ මුල් මාසවල දී ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයක සීඝ්‍රයෙන් ව්‍යාප්තව ගිය අසම්පූර්ණ ජීවනචක්‍රයක් සහිත බෝග වගාවට හානි සිදුකළ කෘමි වර්ගය,

(1) සේනා දළඹුවා ය.
(2) කහ තිත් පලගැටියා ය.
(3) දුඹුරු පැළ කීඩෑවා ය.
(4) ඉල් මැස්සා ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 10	විෂයය / பாடம் / Subject: කෘෂි හා ආහාර තාක්ෂණය	පත්‍රය / வினாத்தாள் / Paper: II	කාලය / காலம் / Time: පැය 02

සැලකිය යුතුයි:

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නයට** හා **තවත් ප්‍රශ්න හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) මෑතක දී ඇති වූ වසංගත රෝග තත්ත්වය හමු වේ එදිනෙදා අත්‍යවශ්‍ය ආහාර බෝග හැකිතාක් තම ගෙවත්තේ ම වගාකර ගැනීමට සැමදෙනා පෙළඹී ඇත.

(i) තම ගෙවත්තේ වගා කර ගත හැකි එළවළු බෝග දෙකක් සහ අල බෝග දෙකක් නම් කරන්න.

(ii) මිනිස් සිරුරේ ප්‍රතිශක්තිය වර්ධනය කර ගැනීම සඳහා දේශීය ඖෂධ භාවිතයට බොහෝ දෙනෙක් නැඹුරු වී ඇත. ගෙවත්තේ සිටුවා ගත හැකි ඖෂධ බෝග දෙකක් නම් කරන්න.

(iii) සෑම විටම ගෙවත්තේ පස වගා කටයුතුවලට සුදුසු නොවනු ඇත. එවිට වගාව සඳහා පස සකස් කර ගැනීමට යොදා ගත හැකි උපක්‍රමය බැගින් ලියන්න.

(a) පසේ මැටි අධික වූ විට -

(b) පසේ වැලි අධික වූ විට -

(iv) ගෙවතු වගාව සඳහා භාවිත කළ කාබනික පොහොර වර්ග දෙකක් නම් කරන්න.

(v) ගෙවත්තේ මූලික බිම් සැකැසීමට යොදාගත හැකි මිනිස් බලයෙන් ක්‍රියාකරන උපකරණ දෙකක් නම් කරන්න.

(vi) ඉඩකඩ වඩාත් ඵලදායීව භාවිත කිරීමට බඳුන්ගත වගාව ද යොදා ගත හැකි ය. ඒ සඳහා භාවිත කළ හැකි, පරිසර හිතකාමී බඳුන් වර්ග දෙකක් නම් කරන්න.

(vii) වර්ෂාව අඩු අවස්ථාවල දී ගෙවතු වගාව සඳහා යොදාගත හැකි ජලසම්පාදන ක්‍රමයක් නම් කරන්න.

(viii) එළවළු වගාවට හානිකරන පළිබෝධකයන් දෙදෙනෙකු නම් කරන්න.

(ix) පළිබෝධ හානි අවම කර ගැනීමට යොදාගත හැකි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(x) සමහර බෝග වර්ගවල බීජ, පැළ කරගැනීමට තවාන් භාවිත කරනු ලැබේ. තවාන් වර්ග දෙකක් නම් කරන්න.
(ලකුණු 2 × 10 = 20)

(02) දේශගුණික සාධක, ක්ෂේත්‍ර බෝග වගාවේ දී අස්වනු ප්‍රමාණය හා අස්වැන්නේ ගුණාත්මය තීරණය කිරීම සඳහා බොහෝ දුරට බලපායි.

(i) (a) යම් ප්‍රදේශයක උෂ්ණත්වය වෙනස් වීමට බලපාන සාධක තුනක් දක්වන්න.
(ලකුණු 03)

(b) උෂ්ණත්වය බෝග වගාවට බලපාන ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) (a) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා කන්න දෙකකට අනුව බෝග වගාව සිදු කෙරේ. එම වගා කන්න තීරණය කරන ප්‍රධාන දේශගුණික සාධකය කුමක්ද? (ලකුණු 01)

(b) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා කන්න දෙක සඳහන් කර, එම කන්න දෙකට අදාළ කාල වකවානු (මාස) දක්වන්න. (ලකුණු 04)

(03) පසේ භෞතික, රසායනික හා ජෛව ලක්ෂණ මනාව හැසිරවීම මගින් බෝග වගාව සඳහා සුදුසු පාංශු පරිසරයක් නිර්මාණය කර ගත හැක හැකි ය.

(i) (a) පසේ පහත දැක්වෙන ලක්ෂණ භෞතික හා රසායනික ලක්ෂණ ලෙස වෙන්කර දක්වන්න.

- පාංශු වර්ණය
- පාංශු ප්‍රතික්‍රියාව
- කැටයන හුවමාරු ධාරිතාව
- පාංශු වයනය

(ලකුණු 02)

(b) පාංශු වයනය බෝග වගාවට බලපාන ආකාර තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) (a) ශ්‍රී ලංකාවේ පසේ බහුලව දක්නට ලැබෙන පාංශු ව්‍යුහ ආකාර තුනක් නම් කරන්න. (ලකුණු 03)

(b) පාංශු ව්‍යුහ සෑදීම සඳහා උපකාරීවන බන්ධන කාරක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(04) වගා කන්නය ආරම්භයත් සමගම වගා ක්ෂේත්‍රයේ බිම් සැකසීම හා තවාන් සකස් කිරීම සිදු කරනු ලැබේ.

(i) (a) තවානක සිටුවා පැළ ලබාගැනීමෙන් ඇතිවන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) තවාන් මිශ්‍රණයක් ජීවානුහරණය කරගන්නා ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) (a) වර්ෂාව අධික ප්‍රදේශයක තවාන් සකස්කර ගැනීමට සුදුසු තවාන් ක්‍රමය කුමක් ද? (ලකුණු 01)

(b) මුල් නොකැඩී, පහසුවෙන් පැළ අලෙවිකර ගැනීම සඳහා යොදාගත හැකි තවාන් වර්ගයක් නම් කරන්න. (ලකුණු 01)

(iii) (a) පහත සඳහන් බෝග පැළ සිටුවීමේ දී යොදා ගන්නා බෝග සංස්ථාපන ක්‍රමයක් බැගින් සඳහන් කරන්න.

- බඩඉරිඟු
- අන්නාසි
- පොල්

(ලකුණු 03)

(b) වී වගාවේ ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍රය භාවිත කිරීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 01)

(05) පහතරට වියළි කලාපයේ වී සහ එළවළු බෝග වගා කරන ගොවියෙක් ජලසම්පාදනය සඳහා භූතල ජලසම්පාදන ක්‍රම යොදා ගැනීමට සැලසුම් කර ඇත.

(i) (a) වී වගාව සඳහා සුදුසු භූතල ජලසම්පාදන ක්‍රමය කුමක් ද? (ලකුණු 01)

(b) වියළි කලාපයේ භූතල ජලසම්පාදන ක්‍රම භාවිතය නිසා ඇතිවන ගැටළු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජලසම්පාදන ක්‍රමයක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු තුනක් දක්වන්න.
(ලකුණු 03)

(iii) (a) බිංදු ජලසම්පාදනය හා ඉසින ජලසම්පාදනය යන ක්‍රම දෙක අතර, සමාන ලක්ෂණයක් සහ වෙනස් වූ ලක්ෂණයක් බැගින් ලියා දක්වන්න. (ලකුණු 02)

(b) දුර්වල ජලවහනය නිසා එළවළු වගාවේ ඇතිවිය හැකි ගැටළු දෙකක් ලියන්න.
(ලකුණු 02)

(06) වල් පැළ වර්ධනය, රෝග ඇතිවීම සහ කෘමීන් හා වෙනත් සතුන්ගේ හානි බෝග වගාවේ දී ගොවියා මුහුණපාන ගැටළුකාරී තත්ත්ව වේ.

(i) (a) වගා බිමේ වල් පැළෑටි වර්ධනය වීම නිසා, ඇතිවන හානි හතරක් ලියන්න.
(ලකුණු 02)

(b) වල් පැළෑටි පාලනය සඳහා යොදන වල් නාශක, ඒවායේ ක්‍රියාකාරීත්වය අනුව වර්ග කර දක්වන්න.
(ලකුණු 02)

(ii) (a) ගෙවත්තක වගා කර තිබුණු එළවළු බෝගවල පත්‍ර විචිත්‍ර වීමෙන් මල් හා ඵල විකෘති වීම දක්නට ලැබුණි. එයට හේතුවන රෝග කාරකයා නම් කරන්න. (ලකුණු 01)

(b) එම රෝග කාරකයා පාලනය සඳහා යොදාගත හැකි ක්‍රම දෙකක් ලියා දක්වන්න.
(ලකුණු 02)

(iii) (a) කෘමි පළිබෝධ, බෝගවලට හානි සිදු කරන ආකාර තුනක් ලියන්න. (ලකුණු 1 1/2)

(b) වගා භූමිය තුළට සත්ත්ව පළිබෝධ ඇතුළුවීම වළක්වාගත හැකි ක්‍රම තුනක් දක්වන්න.
(ලකුණු 1 1/2)

(07) බෝග වගා කිරීමේ දී, කාබනික හා රසායනික පොහොර වර්ග මිශ්‍රව යෙදීමෙන් ශාකයේ වර්ධනය හා අස්වැන්න වැඩි කර ගත හැකි ය.

(i) (a) කාබනික පොහොර භාවිත කිරීමේ වාසි දෙකක් ලියන්න. (ලකුණු 02)

(b) රසායනික පොහොර භාවිත කිරීමේ වාසි දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශාක පෝෂක ඌනවීම නිසා දැකගත හැකි ලක්ෂණ තුනක් පහත දැක්වේ. එම ඌනතාවයන් මග හරවා ගැනීමට යෙදිය හැකි රසායනික පොහොර වර්ගය බැගින් ලියා දක්වන්න.

(a) මේරූ පත්‍ර කහ පැහැවීම.

(b) මේරූ පත්‍ර දම් පැහැ වීම.

(c) පත්‍ර දාර පිළිස්සුණු ස්වභාවයක් ගැනීම.
(ලකුණු 03)

(iii) (a) ගෘහස්ථව කාබනික දියර පොහොර නිස්සාරණය සඳහා යොදාගත හැකි ශාක හා සත්ත්ව අමුද්‍රව්‍යය බැගින් ලියන්න.
(ලකුණු 01)

(b) පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට වැදගත්වන පාංශු සාධක දෙකක් ලියන්න.
(ලකුණු 02)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Western Province Education Department මேல் மாகாணக் கல்வித் திணைக்களம்

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade	10	විෂයය / பாடம் / Subject	කෘෂි හා ආහාර තාක්ෂණය	පත්‍රය / வினாத்தாள் / Paper	I,II

I - පත්‍රය

(1) 4	(11) 4	(21) 4	(31) 1
(2) 3	(12) 3	(22) 3	(32) 3
(3) 2	(13) 2	(23) 1	(33) 2
(4) 3	(14) 3	(24) 2	(34) 3
(5) 2	(15) 4	(25) 3	(35) 2
(6) 1	(16) 1	(26) 1	(36) 2
(7) 4	(17) 1	(27) 1	(37) 3
(8) 2	(18) 3	(28) 1	(38) 1
(9) 3	(19) 3	(29) 4	(39) 3
(10) 3	(20) 2	(30) 3	(40) 2

(ලකුණු 1x40=40)

II පත්‍රය

(01) (i) එළවළු බෝග - වම්බටු, කරවිල, බණ්ඩක්කා, ගෝවා.
අල බෝග - බතල, මඤ්ඤොක්කා, හිඟුරල (වැල් අල)

(ii) ඉඟුරු, හාතවාරිය, නීරමුල්ලිය

(iii) (a) වැලි මිශ්‍ර කර ගැනීම.
(b) කොම්පොස්ට් එකතු කිරීම.

(iv) කොම්පෝස්ට්, අමු කොළ පොහොර, ගොම/කුකුල් පොහොර (සත්ත්ව පොහොර)

(v) උදැල්ල, උදළු මුල්ලුව, රේක්කය, හෝව, අත් ඉස්කෝප්පය

(vi) පොල් ලෙලි බඳුන්, පරණ කිරි හට්ටි, කඩදාසි බඳුන්, කෙසෙල් පට්ටා බඳුන්, පරණ ටයර්, මැටි බඳුන්, ඉවතලන බාල්දි.

(vii) ඉසින ජලසම්පාදනය, මල් බාල්දිවලින් ජලය යෙදීම.

(viii) අවුලකපෝරා, එපිලැක්නා, ඉල්මැස්සා, කොළ හකුළන දළඹුවා, කුඩිත්තන්, පිටිමකුණා, සුදුමැස්සා.

(ix) එළවළු වල එල ආවරණය කිරීම, පස පෙරළීම, හානි වූ එල විනාශ කිරීම.

(x) බඳුන් තවාන්, උස් තවාන්, කුට්ටි තවාන් (නොරිදෝකෝ) (ල. 2 × 10 = 20)

(02) (i) (a) සමකයේ සිට ඇති දුර, උච්චත්වය, මුහුදේ සිට ඇති දුර, වනගහනය, අභ්‍යන්තර ජලාශ පිහිටීම. (ල. 1 × 3 = 3)

(b) බීජ ප්‍රරෝහණයට, දඬුකැබලි මුල් ඇද්දවීමට, ප්‍රභාසංස්ලේෂණයට, උත්ස්වේදනයට, අල බෝගවල ආකන්ද ඇතිවීමට. (ල. 1 × 2 = 2)

(ii) (a) වර්ෂාපතනය (ල. 1)

(b) යල කන්නය - මාර්තු සිට අගෝස්තු දක්වා
මහ කන්නය - සැප්තැම්බර් සිට පෙබරවාරි දක්වා (ල. 2× 2 = 4)

(මුළු ලකුණු 10)

(03) (i) (a) භෞතික ලක්ෂණ - පාංශු වයනය, පාංශු ව්‍යුහය (ල. 01)
රසායනික ලක්ෂණ - පාංශු ප්‍රතික්‍රියාව, කැටායන හුවමාරු ධාරිතාව (ල. 01)

(b) පසට ගැලපෙන බෝග තෝරා ගැනීමට, වගාවට සුදුසු පරිදි වයනය දියුණු කර ගැනීමට, බිම් සැකසීමට සුදුසු උපකරණ තෝරා ගැනීමට, උචිත ජලසම්පාදන ක්‍රම තෝරා ගැනීමට පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීමට. (ල. 1 × 3 = 3)

(ii) (a) කැටිති, තනි කනිකා, ස්ථම්භික, අණු කෝනාකාර කුට්ටි (ල. 1 × 3 = 3)

(b) මැටි, කාබනික ද්‍රව්‍ය (ල. 02)

(මුළු ලකුණු 10)

(04) (i) (a) නිරෝගී පැළ පමණක් තෝරාගෙන සිටුවාගත හැකි වීම, කුඩා බීජ නිසා කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවීමෙන් බීජ නාස්ති වීම සිදුවීම, අඩු බීජ ප්‍රමාණයකින් පැළ නිපදවාගත හැකි වීම, තවානේ පැළවලට ගැලපෙන සේ පරිසර තත්ත්ව පාලනය කළ හැකි වීම. (ල. 1 × 2 = 02)

(b) පිළිස්සීම මගින්, උණු ජලය යෙදීමෙන්, සූර්ය තාපය භාවිතයෙන්, රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් (ල. 1 × 2 = 02)

(ii) (a) උස් තවාන් (ල. 01)

(b) කුට්ටි තවාන් / බඳුන් තවාන් (ල. 01)

(iii) (a) බඩඉරිඟු - තනි පේළි ක්‍රමය
අන්නාසි - දෙපේළි ක්‍රමය
පොල් - සමචතුරස්‍ර ක්‍රමය (ල. 03)

(b) වී වගාවේ ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍රය භාවිත කිරීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 2× ½ × 01)

(මුළු ලකුණු 10)

(05) (i) (a) පිටාර ජලසම්පාදනය (ල. 1 × 1 = 01)

(b)
- වාෂ්පීකරණය මගින් ජලය අපතේයාම වැඩි ය.
- පාංශු ඛාදනය වැඩි ය.
- පසේ ලවණ තැන්පත් වීය හැකි ය.
- අවශ්‍ය ජල ප්‍රමාණය වැඩි ය.
- පළිබෝධ ව්‍යාප්ත විය හැකි ය. (ල. 1 × 2 = 02)

(ii)
- වගා කර ඇති බෝගය
- බෝගයේ වර්ධන අවස්ථාව
- ජලය සැපයීමේ අරමුණ

- පසේ වයනය (ල. 1 × 3 = 03)

(iii) (a) සමාන ලක්ෂණ :

- අවශ්‍ය ජල ප්‍රමාණය අඩු යි.
- ජල සම්පාදන කාර්යක්ෂමතාවය වැඩි යි.
- ජලය සමග පොහොර යෙදිය හැකි යි.
- සකස් කිරීමට තාක්ෂණික දැනුමක් අවශ්‍ය යි. (ල. 1 × 1 = 01)

වෙනස් වූ ලක්ෂණ :

බිංදු ජලසම්පාදනය	ඉසින ජලසම්පාදනය
ජල බිංදු ලෙස බෝගය මුලට ලැබේ	ජලය ඉස්නාවක් ලෙස පත්‍රවලට හා මුලට ලැබේ.
ඕනෑම ස්ථානයකට යොදා ගත හැකිය පරාගනයට ගැටළුවක් ඇති නොවේ	අධික සුළං තත්ත්ව වලදී යොදාගත නොහැකි ය. පරාග සේදී යා හැකි ය.

(ල. 1 × 1 = 01)

(b) • ශාක මැලවීම හෝ මැරීයාම.
- මුල් වර්ධනය දුර්වල වීම නිසා ශාක පහසුවෙන් ඉදිරී වැටීම.
- ශාක මුල් ආශ්‍රිත රෝග පැතිරීම. (ල. 1 × 2 = 02)

(මුළු ලකුණු 10)

(06) (i) (a) • වගාවේ අස්වැන්න අඩු කරයි.
- රෝග හා පළිබෝධ ව්‍යාප්තිය සිදු කරයි.
- පොහොර ජලය හා ආලෝකය ඉඩකඩ සඳහා බෝගය සමග තරග වදියි.
- අස්වැන්නේ ගුණාත්මකභාවය අඩු කරයි.
- ජලසම්පාදන කාණු අවහිර කරයි. (ල. 1 × 2 = 02)

(b) ස්පර්ශක වල්නාශක
සංස්ථානික / පරිසර්පන වල්නාශක (ල. 1 × 2 = 02)

(ii) (a) වෛරසයකි. (ල. 1 × 1 = 01)

(ii) (b) • රෝගී ශාක උදුරා පුළුස්සා දැමීම.
- ඔරොත්තු දෙන ප්‍රභේද වගා කිරීම.
- බෝග මාරුව.
- වාහක කෘමීන් පාලනය.
- වෙනත් ධාරක ශාක වගා බිමෙන් ඉවත් කිරීම. (ල. 1 × 2 = 02)

(iii) (a) • පටක විකා කෑම
- පටක විද යුෂ උරා බීම
- රෝග වාහකයන් ලෙස ක්‍රියා කිරීම
- පත්‍ර හකුළුවා ගැනීම
- ඵල විද ඒ තුළ බිත්තර දැමීම.
- කඳ විද ඒ තුළ බිත්තර දැමීම. (ල. ½ ×3 = 1 ½)

(b) • පළිබෝධ ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම.
- රෝපණ ද්‍රව්‍ය සඳහා පූර්ව ප්‍රතිකාර කිරීම.
- පිරිසිදු රෝපණ ද්‍රව්‍ය භාවිතය.
- පිරිසිදු කාබනික පොහොර භාවිතය.
- විකර්ශක බෝග වගාව.

- නීති අණ පනත් භාවිතය.
- ආරක්ෂිත ගෘහ තුළ වගාව. (ල. ½ ×3 =1 ½)

(මුළු ලකුණු 10)

(07) (i) (a) ශාක පෝෂක සියල්ල ම අඩංගු වීම, පසේ කැටායන හුවමාරු ධාරිතාව වැඩිවීම,පාංශු ව්‍යුහය දියුණු වීම, ජල අවශෝෂණ ධාරිතාව වැඩි වීම, පසේ ක්ෂුද්‍රජීවී ගහණය වැඩිවීම, පසේ pH අගය වෙනස් නොවීම. (ල. 1 × 2 = 02)

(b) ශාකවලට ඉක්මණින් අවශෝෂණය වීම, ඌනතා නිවැරදි කිරීමට යෙදිය හැකි වීම, ගබඩා කර තැබීමට අඩු ඉඩක් ප්‍රමාණවත් වීම, ප්‍රවාහනය පහසු වීම.(ල. 1 × 2 = 02)

(ii) (a) යූරියා/ ඇමෝනියම් සල්ෆේට්

(b) සාන්ද්‍ර සුපර් පොස්පේට්

(c) මියුරියේට් ඔෆ් පොටෑෂ් (ල. 1 × 3 = 03)

(iii) (a) ශාක - ග්ලිසීරියා පත්‍ර, ඉපිල් ඉපිල් පත්‍ර, මුරුංගා පත්‍ර

සත්ත්ව - කුකුළු පොහොර (ල. ½ × 2 = 01)

(b) පසේ ඇති පෝෂක, පසේ තෙතමනය (ල. 1 × 2 = 02)

(මුළු ලකුණු 10)